**මධ්‍යම සංස්කෘතික අරමුදල - 2020**

---

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු 2018, 2019 සහ 2020 වර්ෂවල පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වාම විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

---

**2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්**

---

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | අධ්‍යක්ෂ ජෙනරාල්ගේ පිළිතුර | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 4 (ඇ) වගන්තිය | පාලක මණ්ඩලය විසින්ම හෝ මණ්ඩලය ලියවිල්ලකින් බලය පවරනු ලැබූ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අරමුදල වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීම සිදුකල යුතු වුවද එවැනි බලය පැවරීමක් සිදුකර නොතිබූ අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරී විසින් රු.6,527,400ක් වූ කොන්ත්‍රාත්තුවක් සඳහා වූ ගිවිසුමකට අත්සන් තබා තිබුණි. | මෙම කාල සීමාව තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලෙහි අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ කිසිවකු නොසිටි බැවින් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට මෙම කොන්ත්‍රාත් ගිවිසුම් වලට ප්‍රධාන පරිපාලන නිළධාරී අත්සන් තබා තිබේ. | පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1) හා 102 වගන්ති | අරමුදල ආදායම් බදු නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ආදායම් බදු සඳහා ලියාපදිංචි වී 2018/2019, 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු ගෙවීමටද කටයුතු කර නොතිබුණි. | 1980 අංක 57 දරණ මධ්‍යම සංස්කෘතික අරමුදල පනතෙහි 11(2) වගන්තිය අනුව 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු බද්දකින් අරමුදල නිදහස් විය. මධ්‍යම සංස්කෘතික අරමුදල පනත සියලුම ආදායම් බදු පනත් වලින් නිදහස්වන පරිදි සංශෝධනය කරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6(1)(අ) හා 12 උප වගන්ති | පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා වෙත ලියාපදිංචි නොකල ටෙන්ඩර්කරුවන් සඳහා 2015 සිට 2019 වර්ෂය දක්වා අරමුදල විසින් එකතුව රු.2,132,384,064ක ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | එකග වෙමි. එවකට සිටි පාලන අධිකාරිය 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ ප්‍රකාරව කටයුතු සිදු කර නොමැති බව පිළිගන්නා අතර ඉදිරියේදී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි කටයුතු කරනු ලැබේ. | පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුයි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | (i) II වන පරිච්ඡේදයේ 1.7 ඡේදය | අනුමත නොවූ "අධ්‍යක්‍ෂ" තනතුරු 8ක් සඳහා බඳවා ගැනීම් සිදුකර අධ්‍යක්‍ෂවරයෙකුට හිමි මාසික දීමනා ඇතුළු වරප්‍රසාද ලබාදී තිබුණි. | පෙන්වා දී ඇති නිළධාරීන් 06 දෙනෙකුගේ සේවය අවසන් කර තිබේ. ඉතිරි අධ්‍යක්ෂවරුන් දෙදෙනා සේවා අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩල අනුමැතිය යටතේ රදවාගෙන දීමනා ගෙවීම් කර තිබේ. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව බඳවා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| | (ii) II වන පරිච්ඡේදයේ 1.3 ඡේදය | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් “කාර්ය මණ්ඩලය අනුමත කිරීම” මැයෙන් නිකුත් කරන ලද අංක DMS/E1/54/9/241 හා 2011 ජුලි 21 දිනැති ලිපිය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව නව තනතුරු ඇතිකිරීමට හා 2011 ජුනි 30 දිනෙන් පසුව අනුමත තනතුරුවල සිදුවන පුරප්පාඩු පිරවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගත යුතු වේ. එසේ අනුමත කර නොගත් තනතුරු 12 ක් සඳහා බඳවාගත් නිලධාරීන්ගෙන් 06 දෙනෙකුගේ තනතුරු නාම බඳවාගැනීම් පරිපාටියේ නොමැති | එකග වෙමි. මෙහි සඳහන් තනතුරු 06 න් නිළධාරීන් දෙදෙනෙකුගේ සේවය දැනටමත් අවසන් කර ඇත. ඉතිරි තනතුරු 04 සඳහා සේවා අවශ්‍යතාවය මත පාලක මණ්ඩල අනුමැතිය ඇතිව බඳවා ගැනීම් සිදුකර තිබේ. | අනුමත තනතුරු සඳහා පමණක් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සේවකයන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | තනතුරු වූ අතර, එම නිලධාරීන්ට 2020 ජනවාරි සිට 2020 ජූනි දක්වා එකතුව රු.1,161,740 ක් ගෙවා තිබුණි. | | |
| (iii) II වන පරිච්ඡේදයේ 9.1ඡේදය හා 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත් සංවර්ධන) අපේගම විශේෂ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ, සහ අධ්‍යක්ෂ (පාලන)ගේ පෞද්ගලික සහකාර යන තනතුරු සඳහා විශ්‍රාමික නිලධාරීන් පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විශ්‍රාමික නිළධාරීන් නැවත සේවයේ යෙදවීමේදී පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. අරමුදලේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අනුමත කර ගන්නා තෙක් අධ්‍යක්ෂ (පාලන මානව සම්පත් සංවර්ධන) මහතාගේ සේවය ලබා ගැනීමට 213 වන පාලක මණ්ඩලය විසින් තීරණය ලබා දී තිබේ. | ආයතන සංග්‍රහයේ සහ චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති අංක PED–12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 4.2.6 ඡේදය | 2020 කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කොවිඩ් උවදුර හේතුවෙන් 2020 කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. | කාර්යසාධන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ii)6.5.3 ඡේදය | 2016, 2017 වර්ෂවල වාර්ෂික වාර්තා 2022 ජනවාරි 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2016, 2017 වාර්ෂික වාර්තාවල සංශෝධනය කරන ලද අමාත්‍ය මණ්ඩල සටහන් 2022/01/06 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබේ. | වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඊ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | මාස 06 ක වැඩ බලන කාලය ඉක්මවූ වැඩ බැලීමේ පත්වීම් 72 ක් පුරප්පාඩු පිරවීමකින් තොරව දිගින් දිගටම වැඩ බැලීමේ පදනමින්ම පවත්වාගෙන ගොස් තිබුණි. | අරමුදලේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අනුව මේ වන විට බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය වෙමින් පවතින බැවින් එය අනුමත වූ පසු තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (එ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02.1 ඡේදය සහ 2009 ජූනි 17 දිනැති අංක 09/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| | i. පැමිණීම පිටවීම සනාථ කිරීමකින් තොරව නිලධාරීන් 06 දෙනකු සඳහා 2019 ජූනි සිට 2020 ජූලි දක්වා වැටුප් ලෙස රු. 1,338,051 ක් ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් අංශ ප්‍රධාන රැස්වීම් මගින් අදාළ නිළධාරීන් දැනුවත් කර අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර ලදී. මේ වන විට නිළධාරීන් ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සහ අත්සන් ලේඛණයේ අත්සන් තැබීම සිදු කරනු ලබයි. | සේවයේ යෙදීම තහවුරු නොකල ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| | ii. 2019 ජූනි 11 දින වැඩ භාරගෙන එදින සිටම සේවයට වාර්තා කර නොතිබූ අධ්‍යක්ෂවරයෙකුට මාස 03ක වැටුප් ලෙස රු. 192,772 ක් ගෙවා තිබුණි. | පිලිතුරු දී නැත. | අදාල ගෙවූ වැටුප් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| | iii. අනුමත තනතුරක් නොතිබියදී ජාත්‍යන්තර කටයුතු අධ්‍යක්ෂ ලෙස 2020 පෙබරවාරි මාසයේ සිට පත්කරන ලද නිලධාරියාට එදින සිට ඔක්තෝබර් දක්වා අරමුදලේ කිසිදු කාර්යයක් ඉටුකර නොතිබූ අතර අග්‍රාමාත්‍ය කාර්යාලයේ සේවය කර ඇති බවට ඉදිරිපත් කල ලිපියක් පදනම් කරගෙන මාස 09 ක් සඳහා වැටුප් වශයෙන් රු.1,214,284 ක් අරමුදල විසින් ගෙවා තිබුණි. | තනතුර සඳහා පාලක මණ්ඩල පත්‍රිකා අංක 212.24.1 මගින් අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව පාරිශ්‍රමිකය ගෙවීම් කර ඇත. අග්‍රාමාත්‍ය ලේකම් විසින් ඉදිරිපත් කරන ලද සේවා දිනයන් මේ සඳහා පදනම් කරගෙන තිබිණ. | සේවයේ යෙදීම තහවුරු නොකල ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

## 2.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අරමුදලේ 2019 අයවැය ඇස්තමේන්තුව අනුව සිසු දහම් සෙවන දිප ව්‍යාප්ත වැඩසටහනෙහි ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන1,140 ක් වූ අතර ආර්ථික අපහසුතාවයෙන් යුක්ත සහ ප්‍රමාණවත් ගොඩනැගිල්ලක් නොමැති දහම් පාසල් 332 කට, එක් ගොඩනැගිල්ලක් සඳහා රු.3,433,734 ක් වන පරිදි එකම ගොඩනැගිලි සැලැස්මකට අනුව ගොඩනැගිලි ඉදිකර 2019 ඔක්තෝබර් 30 දින වනවිට නිමකර පරිත්‍යාග කිරීමට මෙමගින් සැලසුම්කර තිබුණි. පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 අනුව රු.මිලියන 250 ඉක්මවූ ප්‍රසම්පාදන අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු මඟින් ක්‍රියාත්මක කල යුතු වුවත් ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 1,140 ක් වූ මෙම වැඩසටහන අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු මඟින් ක්‍රියාත්මක කර නොතිබුණි. | සිසු දහම් සෙවන වැඩ සටහනට පාලක මණ්ඩලය විසින් පත්‍රිකා අංක 208.57.1 යටතේ අනුමැතිය ලබාදී ඇත. ප්‍රසම්පාදනයේ මුළු වටිනාකම පදනම් කරගෙන 2019 වර්ෂයේදී මෙම ප්‍රසම්පාදනය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කර ඇත. එහිදී ඉදිකිරීම් ප්‍රගතිය, පාලක මණ්ඩල තීරණය හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ අමාත්‍යාංශයේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු තීරණය යන අවශ්‍යතා සපුරාලමින් සංදේශය නැවත ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුයි. |
| (ii) වැඩසටහනේ අදියර 3ක් යටතේ වූ ඉදිකිරීම් කාර්යයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1.6ට පටහැනිව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ එක් ගොඩනැගිල්ලක් රු.3,484,500 ක් වන පරිදි ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව වෙත පිළිවෙලින් ගොඩනැගිලි 45ක්, 112ක් හා 211ක් බැගින් පවරා තිබුණි. අදියර 03 ක් යටතේ මෙම ගොඩනැගිලි 368 ක ඉදිකිරීම සඳහා රු.මිලියන 1,282.2 ක ප්‍රතිපාදන අවශ්‍ය විය. එය අනුමත ප්‍රතිපාදන රු.මිලියන 142.2 කින් ඉක්මවා තිබුණි. | මු.රෙ 787 ට අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට සෘජුව ඉදිකිරීම් වැඩ පැවරීමේ හැකියාවක් ඇත. අ.ම.ප. 15/0219/620/001-1 හා 2015.04.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා පාලක මණ්ඩල අනුමැතිය මත කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව හා අනුමත ප්‍රතිපාදන තුල ව්‍යාපෘති මෙහෙයවීමට කටයුතු කළ යුතුයි. |
| (iii) ඉදිකිරීම් කටයුතු පවරා තිබුණු ආයතන 3 වෙත 2019 ඔක්තෝම්බර් 30 දින වනවිට ගොඩනැගිලි 298 ක් ඉදිකිරීම සඳහා | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් මේ වන විට අදාළ ගොඩනැගිලි 45 වැඩ අවසන් කර ඇත. රාජ්‍ය ඉංජිනේරු | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| රු.753,500,000ක අත්තිකාරම් ලබා දී තිබුණි. ඉන් 2019 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබාදී තිබූ අත්තිකාරම් මුදලින් රු.28,326,073 ක්ද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබා දී තිබූ අත්තිකාරම් මුදලින් රු.68,861,887 ක් හා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට ලබා දී තිබූ අත්තිකාරම් මුදලින් රු.221,932,662 ක් ද පියවා නොතිබුණි. | සංස්ථාවට අත්තිකාරම් ලෙස ලබා දුන් රුපියල් මිලියන 278.7 ක මුදල ඉක්මවා වැඩ නිමවා ඇති අතර ගොඩනැගිලි 65 ක් නිවැරදිව භාරගෙන හා ගොඩනැගිලි 21 ක් වැඩ අවසන්ව භාර ගැනීමට නියමිතව ඇත. ඉතිරි ගොඩනැගිලි 26 න් 65% ක භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරයි. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට අත්තිකාරම් ලෙස ලබා දුන් රුපියල් මිලියන 353.3 ක මුදල ඉක්මවා වැඩ නිමවා ඇති අතර ගොඩනැගිලි 44 ක් නිවැරදිව භාරගෙන හා ගොඩනැගිලි 123 ක 93% ක භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. ඉතිරි ගොඩනැගිලි 44 හි ප්‍රගතිය 10% සිට 21% අතර පවතී. | යුතුයි. |
| (iii) දෙවන අදියර යටතේ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට පවරා තිබූ වටිනාකම රු.428,593,500ක් වූ ගොඩනැගිලි 123 ක ඉදිකිරීම් වලින් ගොඩනැගිලි 77 ක ඉදිකිරීම් පමණක් නිමකර තිබුණි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට වටිනාකම රු.299,667,000 ක්වූ ගොඩනැගිලි 86 ක ඉදිකිරීම් පවරා තිබුණද ඉදිකිරීම් ප්‍රගතිය දැක්වෙන වාර්තා සකස් කර නොතිබීම හේතුවෙන් කොපමණ ගොඩනැගිලි ප්‍රමාණයක් නිමකර තිබුණේද යන්න හඳුනාගත නොහැකි විය. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබා දී ඇති ගොඩනැගිලි 112 න් 65 ක් වැඩ අවසන් කර භාර දී ඇති අතර ගොඩනැගිලි 21 ක් වැඩ අවසන්ව භාර ගැනීමට නියමිතව ඇත. ඉතිරි ගොඩනැගිලි 26 න් 65% ක භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරයි. | ඉදිකිරීම් ආයතන බැඳීමට යටත්වන පරිදි ගිවිසුම් වලට එළඹීමටද නිසි පරිදි වාර්තා ලබා ගැනීමටද කටයුතු කළ යුතුයි. |
| (vii) තෙවන අදියර යටතේ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට පවරා දී තිබුණු වටිනාකම රු.97,566,000 ක්වූ ගොඩනැගිලි 88 ක ඉදිකිරීම් හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා දී තිබුණු ගොඩනැගිලි 26 ක ඉදිකිරීම් අතරමඟ නවතා දමා තිබුණි. | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව ගොඩනැගිලි 211 න් ගොඩනැගිලි 44 ක් වැඩ අවසන් කර භාර දී ඇත. ඉතිරි ගොඩනැගිලි 123 ක 93% ක භෞතික ප්‍රගතියක් පෙන්නුම් කරන අතර ඉතිරි ගොඩනැගිලි 44 හි ප්‍රගතිය 10% සිට 26% අතර පවතී. | ව්‍යාපෘති අරමුණු ඉටුකර ගත හැකි වන පරිදි හා ඉදිකිරීම් ආයතන බැඳීම් වලට යටත් වන පරිදි ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වෙනත් සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා 2017, 2018, 2019 හා 2020 වර්ෂ වල පිළිවෙලින් රු.519,546,178 ක්, රු.121,427,616 ක්, රු.387,947,025 ක් හා රු.7,681,849ක් වශයෙන් එකතුව රු.1,036,602,668ක් වැයකර තිබුණි. පහත | | |

නිරීක්ෂණ කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | අනුමත කර තිබූ මුදලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 49ක් වෙත 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා නිදහස් කරන ලද මුදල රු.178,968,648ක් විය. එම මුදලින් රු.146,538,215ක් එම කාර්යාල විසින් උපයෝජනය කර තිබූ අතර රු.32,430,433ක්වූ ඉතිරි ප්‍රතිපාදන වලින් රු.21,743,656ක් අරමුදල වෙත ආපසු එවා තිබුණි. එම මුදලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3කට ලබා දී තිබූ එකතුව රු.2,682,297 ක් කිසිදු මුදලක් උපයෝජනය කිරීමකින් තොරවම ආපසු එවා තිබුණි. | වෙනත් සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා මුදල් නිදහස් කිරීමේදී විෂය දැනුමැති තාක්ෂණික නිළධාරීන් විසින් ඇස්තමේන්තු පිළියෙල කොට අනුමත කර ඉදිරිපත් කර තිබුණි. | අරමුදල් මනා කළමනාකාරිත්ව යෙන් යුතුව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ii) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04ක් විසින් වර්ෂ 01 ක සිට වර්ෂ 06 ක අතර කාලයක් රු.10,406,602ක් වූ එම ඉතිරි මුදල් පොදු තැන්පත් ගිණුම් වල රඳවා තබා තිබුණි. | පොදු තැන්පත් ගිණුම් වල රඳවා තිබූ මුදල් ආපසු එවන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලිඛිත දැන්වීම් කර ඇත. මෙයින් කොටසක් අරමුදල වෙත ලබා දීමට කටයුතු කර තිබුණි. | පොදු තැන්පත් ගිණුම් වල රඳවා ඇති මුදල් නැවත අරමුදල වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ විශ්‍රාම ශාලාව රු.98,590,000ක ඇස්තමේන්තුගත පිරිවැයකින් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණද මුල් ඇස්තමේන්තු පිරිවැය රු. 124,022,750 ක් දක්වා සියයට 25 කින් වර්ධනය වී තිබුණි. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2019 පෙබරවාරි මස ඉදිකිරීම් ආරම්භ කර තිබූ මෙහි 2021 මාර්තු වන විට භෞතික ඉදිකිරීම් ප්‍රගතිය සියයට 50 කටත් අඩු මට්ටමේ විය. | නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන විශ්‍රාම ශාලාව ඉදි කිරීම සඳහා රු.98,590,000 මුදලක් ඇස්තමේන්තු කර ඇත්තේ ශ්‍රම පිරිවැය ද සමඟ වේ. රජයේ ප්‍රතිපත්ති අනුව මෙම ඉදි කිරීම ශ්‍රී ලංකා නාවික හමුදාවට භාර දීමේ පදනම මත එම රු.98,590,000 තුල ඇති ශ්‍රම වියදම ඉවත් කල පසු තවදුරටත් වියදම අවම වීම සිදු වී ඇත. අදාල අමුද්‍රව්‍ය නාවික හමුදාව වෙත ලබා දී ඇත්තේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසුව වේ. ව්‍යාපෘතියේ ඉදිරි වැඩ නායක ස්වාමීන් වහන්සේ විසින් නිමකර ගැනීමට එකඟතාවය පළකර ඇත. | ප්‍රශස්ථ සැලසුම්කරණය කින් හා සම්බන්ධීකරණය කින් යුතුව සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කළ යුතුයි. |
| (ඈ) | වාද්දුව, දම්පියගම ශ්‍රී සමුද්‍රාරාම විහාරස්ථානයේ තෙමහල් සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව පෞද්ගලික සැලසුම් ආයතනයක් විසින් 2017 මාර්තු 20 දින පිළියෙල කරන ලද රු.35,000,000ක ඇස්තමේන්තුවකට අනුව කළුතර දිස්ත්‍රික් ලේකම් වෙත 2017, 2018 හා 2019 වර්ෂවල අවස්ථා 04 කදී එකතුව රු.27,521,531ක් ලබාදී තිබුණි. කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් තාක්ෂණික නිලධාරියෙකුගේ අධීක්ෂණය සහ | නිරීක්ෂණ නිවැරදිය. ප්‍රාදේශිය ලේකම් විසින් අදාල ගෙවීම් සඳහා අනුමැතිය දීමට පෙර තාක්ෂණික නිලධාරීයකුගේ නිර්දේශ සහ සහකාර අධ්‍යක්ෂ සැලසුම්ගේ නිර්දේශ ලබා ගෙන ඇත. එම නිසා දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රාදේශිය ලේකම් වෙත මුදල් නිදහස් කිරීම සිදුකල ද එහි ගෙවීම් වගකිම ප්‍රාදේශිය ලේකම් සතු වේ. තාක්ෂණික | ප්‍රශස්ථ සැලසුම්කරණය කින් හා සම්බන්ධීකරණය කින් යුතුව අරමුදල් මෙහෙය වීමට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | සහතික කිරීම තුලින් ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සහ ප්‍රමිතිය පිළිබඳව තහවුරුවක් ලබානොගෙන පානදුර ප්‍රාදේශීය ලේකම් වෙත ලද මුළු මුදලම 2017, 2018 හා 2019 වර්ෂවල ගෙවා තිබුණි. එම මුදලින් රු2,276,814 ක් 2020 දෙසැම්බර් 12 දින සිට 2021 පෙබරවාරි 11 දක්වා පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය පොදු තැන්පත් ගිණුමෙහි පැවතුණි. ඉදිකිරීම් වල ප්‍රගතිය පරීක්ෂාකිරීමට සහ ඉතිරි වැඩ සඳහා අවශ්‍ය අරමුදල් ලබාදී ගොඩනැගිල්ල භාවිතයට ගතහැකි තත්වයට පත්කිරීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. | නිලධාරි විසින් ඉදිකිරීම් සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණ පත්‍ර හා ගෙවීම් වාර්තා නිර්දේශ කර ඇත.කොවිඩ් තත්ත්වය මත අදාල ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවී පැවතියත් වර්තමානය වන විට මෙහි ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. | කටයුතු කළ යුතුයි. |
| (ඉ) | හබරකඩ ශ්‍රී විජයානන්ද පුරාණ රජමහා විහාරයේ සංඝාවාසය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුව රු.7,345,000ක් වූ අතර අදියර 04න් අදියර 03ක් සඳහා රු.4,478,253ක් තවලම ප්‍රාදේශිය ලේකම් වෙත ලබාදී තිබුණි. කොන්ත්‍රාත්තුවේ වැඩ 2018 මැයි 28 දින අවසන් කල යුතුව තිබුණද 2021 දෙසැම්බර් වනවිටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබූ අතර රු.4,436,227ක් වැයකර තිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. මේ වන විට මෙම ඉදිකිරීම් 85% ක් පමණ අවසන් කොට ඇති අතර මේ වසරේ අවසන් කිරීමට තීරණය කර ඇත. 2020/2021කොවිඩ් තත්වය නිසා අරමුදල් යෙදීමේ අපහසුතාවය මත එහි කටයුතු ප්‍රමාද විය. | ප්‍රශස්ත සැලසුම්කරණය කින් යුතුව අරමුදල් මෙහෙය වීමට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඊ) | කිරම ගල්ටැම්ගොඩ පුරාණ විහාරයේ සංඝාවාසය, ධාතු මන්දිරය සහ පුස්තකාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2019 ජුනි 19 දින පාලක මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ අතර ඊට පෙර 2019 මැයි 02 දින ඇස්තමේන්තුගත මුදලින් සියයට 20ක් එනම් රු.5,577,800ක් පළමු වැනි වාරිකය ලෙස හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත යවා තිබුණි. ලබාදුන් රු.5,577,800ක මුදල අදියර I වශයෙන් සලකා ඇස්තමේන්තු සකසා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා ඉදිකිරීම් සිදු කරගෙන තිබුණද මෙම අදියර වෙන්කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.4ට පටහැනිව සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් හෝ ලබාදුන් රු.5,577,800ක මුදල සම්බන්ධයෙන් අරමුදල පසු විපරම් කර නොතිබූ අතර අදාල මුදලින් ඉතිරිව ඇති රු.681,924ක් 2021 මාර්තු දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගෙන තිබුණි. අරමුදල් ලබා නොදීම මත ඉදිකිරීම් අතරමග නතර කර තිබූ අතර වැයකල මුදලද නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | 2020/2021 වර්ෂ වල ආදායම් අහිමි වීම මත මෙම ඉදිකිරීම් තාවකාලිකව නවතා තිබේ. එහෙත් මෙම ඉදිකිරීම් නිශ්කාර්ය වියදම් වීමට ඉඩනොදී 2022 වසරේ කටයුතු ආරම්භකර ලැබෙන අරමුදල් මත කළමනාකරණය කර කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රශස්ත සැලසුම්කරණය කින් යුතුව අරමුදල් මෙහෙය වීමට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (උ) | ගාල්ල විද්‍යාලෝක පිරිවෙන් මහා විහාරයේ දහම් පාසල් හා ධර්මශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගාල්ල දිස්ත්‍රික් ඉංජිනේරු(ගොඩනැගිලි)ගේ රු.24,233,100ක ඇස්තමේන්තුව මත අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.768,000ක් විහාරස්ථානයට | මෙම ඉදිකිරීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. අමුද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා විහාරස්ථ දායක සභාව වෙත රු. 768,000ක් දිස්ත්‍රික් | ප්‍රශස්ත සැලසුම්කරණය කින් යුතුව අරමුදල් මෙහෙය වීමට |

| | | | |
|---|---|---|---|
| | ලබාදී තිබුණි. අනතුරුව ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පළමු මුදල් නිදහස් කිරීම ලෙස 2019 අගෝස්තු 19 දින රු.4,693,020ක් ලබාදී තිබුණ ද, ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඉදිකිරීමට අදාලව 2018 ජුලි 18 දිනට බුද්ධශාසන අමාත්‍යාංශයේ විමධ්‍යගත අරමුදල් හා පළාත් සභා ප්‍රතිපාදන භාවිතා කර කලවැඩ වටිනාකම රු.2,800,000 ක් වූ අතර මුළු ඇස්තමේන්තු වටිනාකමින් එතෙක් සිදුකර තිබූ ඉදිකිරීම්වල වටිනාකම අඩුකිරීමට කටයුතු කර නොතිබුණි. නාවික හමුදාව විසින් විහාරස්ථාන බිමෙහි දේවාල ගොඩනැගිල්ලක් ඉදිකර එහි භෞතික ප්‍රගතිය සියයට 50 ක් ලෙස වාර්තා කර තිබූ අතර මෙම ඉදිකිරීම ධර්මශාලා ගොඩනැගිල්ල ඉදිකිරීමේ ඇස්තමේන්තුවෙන් පරිබාහිර ඉදිකිරීමක් විය. ධර්මශාලා ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් සඳහා රු.18,772,080 ක් අවශ්‍ය බව නාවික හමුදාපති විසින් 2020 ජුනි 08 දින දැනුම් දී තිබුණද ඊට අදාල ඉදිරි පියවර නොගැනීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නතර වී තිබූ අතර ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 60 ක් පමණක් විය. | ලේකම්ගේ අධීක්ෂණය යටතේ ලබා දී තිබුණි. විහාරස්ථ දායක සභාව විහාරස්ථානයේ පාලක සභාව වන බැවින් කොන්ත්‍රාත් කාර්යයන් ඉටු කිරීමට බලය සහිත ඒකකයක් ලෙස භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇත. අදාල ගොඩනැගිල්ල සඳහා 2016.06.25 වන දින මුල්ගල තබා ඇති අතර එම ගොඩනැගිල්ලේ යම් ඉදිකිරීමක් බුද්ධශාසන අමාත්‍යාංශයේ ආධාර මත සිදු වී ඇත. අදාල ඉදිකිරීම් සඳහා විහාරාධිපති ස්වාමින්වහන්සේගේ ඉල්ලීම් පරිදි අග්‍රාමාත්‍යතුමාගේ නිර්දේශයෙන් අරමුදල විසින් ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත.<br><br>මේ වන විට දානපතින්ගේ ආධාර ඇතිව මෙම ඉදිකිරීම් කටයුතු වැඩි භෞතික ප්‍රගතියක් ලබා සාර්ථකව සිදුකෙරෙමින් පවතී. | හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඌ) | 2010 නොවැම්බර් 20 දිනැති අංක පීඑෆ්/4/සීඑම්/1(Cir) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යුත් මාධ්‍ය හරහා ගෙවීම් ලබා ගැනීමට අවශ්‍ය පද්ධති ඇති කිරීම කළ යුතු වුවත් සීගිරිය ව්‍යාපෘතිය හැර අනෙකුත් ව්‍යාපෘතිවල අන්තර්ජාලය මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට 2021 ඔක්තෝබර් 31 දින වනවිට ද අපොහොසත් වී තිබුණි. | මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රවේශපත් නිකුත් කිරීම සඳහා ගිණුම් මගින් ගෙවීමේ ක්‍රමයක් මහජන බැංකුව සමග සියළුම ආදායම් උපයන ව්‍යාපෘති සමඟ ක්‍රියාත්මක කිරීමට මේ වන විට සියළු සැලසුම් සකස් කොට ඇත. | කාර්යක්ෂම ආදායම් ඉපයීමේ ක්‍රම අනුගමනය කිරීමට කටයුතු කළ යුතුයි. |
| (එ) | රාජකාරි දිනයන්හි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් සිදු කරන භාණ්ඩ සමීක්ෂණ කටයුතු වෙනුවෙන් පාලක මණ්ඩල අනුමැතිය මත, දිනකට විධායක නිලධාරින් සඳහා රු.1,000ක් හා විධායක නොවන නිලධාරින් සඳහා රු.750ක් බැගින් එකතුව රු.1,666,692ක් 2019 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ කටයුතු වෙනුවෙන් භාන්ඩාගාර අනුමැතියෙන් තොරව ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | නිසි අනුමැතිය මත පමණක් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුයි. |

**2.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 1980 අංක 57 දරණ මධ්‍යම සංස්කෘතික අරමුදල පනත කාලානුරූපීව සංශෝධනය කරගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අරමුදල ආරම්භ කල 1980 වසරේ සිට 2018 වර්ෂය දක්වා අරමුදල යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය ව්‍යාපෘති 32 ක් ආරම්භ කර තිබූ අතර ඉන් ව්‍යාපෘති 15 ක් ආරම්භ කර තිබුණේ 2015 සිට 2018 දක්වා වන අතර 2015 වර්ෂයෙන් පසු ආරම්භ කල ව්‍යාපෘති 10 ක් සඳහා පාලක මණ්ඩල, භාණ්ඩාගාර හා අනෙකුත් අනුමැතීන් ලබාගෙන නොතිබූ අතර අනුමැතිය ලැබූ ව්‍යාපෘති 05 න් 03 ක්ම ආරම්භ කිරීමෙන් පසු අනුමැතිය ලබාගෙන තිබුණි. තවද ව්‍යාපෘති කාර්යභාරය ක්‍රියාකාරී සැලසුම්වලට හා අයවැයට ඇතුලත් කිරීමත්, සිදුකර නොතිබුණි. | එකග වෙමි. නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | නව ව්‍යාපෘති ආරම්භ කිරීමේදී සැලසුම්වලට හා අයවැයට ඇතුලත් කිරීමටත් අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමටත් කටයුතු කළ යුතුයි. |
| (ඇ) | 2017 මැයි 26 දිනැති අංක 202.25.01 දරන පාලන මණ්ඩල පත්‍රිකාවට ලද අනුමැතිය මත කොලඹ, බෞද්ධාලෝක මාවතේ අංක 212/1 ස්ථානයේ පිහිටි අරමුදලේ ප්‍රධාන කාර්යාලය 2018 මාර්තු 01 සිට බත්තරමුල්ල සෙත්සිරිපාය II වන අදියරේ 4 වන මහලේ (වර්ග අඩි 5823 ක) ස්ථාපනය කර තිබුණි. ඒ අනුව 2021 අප්‍රේල් 30 දක්වා එම පරිශ්‍රයේ ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන ගොස් තිබුණු අතර ඒ සඳහා ගොඩනැඟිලි කුලිය වශයෙන් රු.65,862,757 ක් ගෙවා තිබුණි. එසේ වුවද අපේක්ෂිත පරිදි නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට හෝ පවතින ගොඩනැගිල්ල නවීකරණය කිරීමට කටයුතු කර නොතිබූ අතර වසර 04 කට පසුව නැවත පැරණි ගොඩනැගිල්ලට 2021 මාර්තු මස සිට ප්‍රධාන කාර්යාලය රැගෙන ගොස් තිබුණි. | අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය අඩපණ වීම හේතුවෙන් බත්තරමුල්ල සෙත්සිරිපායේ කාර්යාල පරිශ්‍රය සඳහා මාසික කුළිය ගෙවා ගැනීමට අපහසු වීම හේතුකොටගෙන නැවත පැරණි කාර්යාල පරිශ්‍රය වෙත ප්‍රධාන කාර්යාලය රැගෙන ඒමට සිදුවිය. බෞද්ධාලෝක මාවත කාර්යාල පරිශ්‍රය අයිතිය පවරා ගැනීමේ නීතිමය කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී. එමෙන්ම එහි නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මූලික සැලසුම් සකස් කිරීමද අවසන් අදියරේ පවතී. | ඉදිකිරීම මනා ලෙස සැලසුම්කිරීමටත් අරමුදල් පාලනය නිසි පරිදි සිදු කිරීමටත් කටයුතු කළ යුතුයි. |
| (ඈ) | 2011 පෙබරවාරි 02 දිනැති අංක අමප/11/0/169/555/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අරමුදල උපයා ඇති ආදායමෙන් සියයට 25 ක් පුරාවිද්‍යා ස්ථාන පවත්වාගෙන යාම වෙනුවෙන් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට ලබා දිය යුතු වුවත් 2017, 2018, 2019 හා 2020 වර්ෂවල ලබා දිය යුතු පිළිවෙලින් රු.764,254,863ක්, රු.571,273,485ක්, රු.213,778,942ක් හා රු.210,779,543ක් වශයෙන් එකතුව රු.1,760,086,783ක් එම අමාත්‍යාංශයට ලබා දී නොතිබුණි. | අදාල වසරවල දී රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ මත ප්‍රධාන ව්‍යාපෘති 2ක් ක්‍රියාත්මක කිරීමට සිදු වීම මත ඉපැයූ ආදායමෙන් 25%ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දීමට නොහැකි වී ඇත. 2022 වසරේ සිට භාණ්ඩාගාරයේ එකගතාව හා අධීක්ෂණය යටතේ මූලික ආදායමෙන් පරිපාලන වියදම් අඩු කිරීමෙන් පසු ඉතිරි මුදලින් 25% ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබාදීමට කටයුතු කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| (ඉ) සසුනෝදය වැඩසටහන මගින් අදියර 03 ක් යටතේ 2017 සිට 2018 මැයි 20 දින දක්වා දිස්ත්‍රික්ක 20ක් තුළ පිහිටි වෙහෙර විහාර හා ආගමික ස්ථාන 1049ක් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.526,341,581ක් වැයකර තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) අදියර I යටතේ විහාරස්ථාන 150 ක් සඳහා එකතුව රු.46,486,385ක් 2017 අගෝස්තු 15 දින ලබාදී තිබුණි. ස්ථානභාර නිලධාරී (පඬුවස්නුවර)ගේ පසු විපරම් වාර්තාව ප්‍රකාරව සංවර්ධන හා සංරක්ෂණ කටයුතු ආරම්භ නොකල විහාරස්ථාන 09 ක් වූ අතර කටයුතු නිම නොකල විහාරස්ථාන 07ක් විය. එම විහාරස්ථාන සඳහා ගෙවන ලද මූල්‍යාධාර පිළිවෙලින් රු.2,743,585 ක් සහ රු.2,504,315 ක් විය. | පළමු අදියර යටතේ දඹදෙණිය, යාපහුව, පොළොන්නරුව, මොණරාගල, පඬුවස්නුවර යන ව්‍යාපෘතිවලට අදාලව සංවර්ධන හා සංරක්ෂණ කටයුතු ආරම්භ නොකළ විහාරස්ථාන 09 හි හා කටයුතු නිම නොකල විහාරස්ථාන 07 පිළිබඳව පෙන්වා දී ඇති කරුණු නිවැරදි වේ. පසු විපරම් වාර්තා ලද වහාම අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බැව් දන්වා සිටිමි. | ප්‍රශස්ත සැලසුම්කරණයකින් යුතුව අරමුදල් මෙහෙයවීමට හා ව්‍යාපෘති පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ii) අදියර II යටතේ ආගමික ස්ථාන 815 ක් සඳහා එකතුව රු.405,439,004ක් 2017 දෙසැම්බර් 04 දින ලබාදී තිබුණි. ව්‍යාපෘති සම්බන්ධයෙන් ලබාදී ඇති පසු විපරම් වාර්තා අනුව ආගමික ස්ථාන 14ක සංවර්ධන කාර්යයන් ආරම්භ කර නොතිබූ අතර, ආගමික ස්ථාන 45 ක සංවර්ධන කාර්යයන් නිම කර නොතිබුණි. ඒ සඳහා ලබා දී තිබූ මූල්‍යාධාර ප්‍රමාණය පිලිවෙලින් රු.6,995,876ක් සහ රු.22,445,810ක් විය. ආගමික ස්ථාන 09කට ලබාදුන් මූල්‍යාධාර රු.4,500,000ක් භාවිතාකර වෙනත් කාර්යයන් සිදුකර තිබුණි. | අදියර II යටතේ පසුවිපරම් කටයුතු සිදු කිරීමට ව්‍යාපෘති කළමණාකරුවන් වෙත පවරා ඇති අතර වාර්තා ලද වහාම අවශ්‍ය ඉදිරි කටයුතු කරනු ලබන බව දන්වමි. | -එම- |
| (iii) අදියර III යටතේ දඹදෙනිය ව්‍යාපෘතියට අදාල ආගමික ස්ථාන 34ක් සහ පඬුවස්නුවර ව්‍යාපෘතියට අදාල ආගමික ස්ථාන 19ක් වශයෙන් නියැදි පරීක්ෂාවට ලක්වූ ආගමික ස්ථාන 53ක් සඳහා රු.500,000 බැගින් එකතුව රු.26,500,000ක ආධාර මුදල් ලබාදී තිබුණි. ආධාර ලබාදුන් ආගමික ස්ථාන 53 සඳහා ලිපිගොනු පවත්වාගෙන ගොස් හෝ ඉටුකල සංවර්ධන කටයුතු පිළිබඳ පසුවිපරම් වාර්තා ලබා ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකර අදාල වාර්තාවන් සපයන ලෙසට අධ්‍යක්ෂවරුන් වෙත පවරන ලදි. එම වාර්තා ලද වහාම අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව කාරුණිකව දන්වමි. | ලබාදුන් අරමුදල් හා ව්‍යාපෘති පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 2.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ ප්‍රධාන කාර්යාලයට හා බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයට ආරක්ෂක සේවාවන් සපයා ගැනීමේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.12.1ට පටහැනිව ලංසු ඉදිරිපත් කල එකම සමාගම වෙතින් ආරක්ෂක සේවාව ලබාගෙන තිබුණි. | 2010 අගෝස්තු 12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව රජය සතු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් විමසා බලා තිබූ නමුත් සේවාවන් ලබා ගැනීමට නොහැකි වී තිබිණ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි.. |
| (ආ) | 2019 වර්ෂයේ පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් විනාශයට පත්වූ කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය ප්‍රතිනිර්මානය කිරීමට අදාලව වියදම රු.13,407,480ක් වැය කර තිබුණි. එම ප්‍රතිසංස්කරණය යුධ හමුදා ශ්‍රම සැපයීමෙන් කර තිබූ අතර කාර්ය ඉටු කිරීම අරමුදලේ හෝ බාහිර උපදේශන ආයතනයක නියාමනයක් මත සිදු වී නොතිබුණි. තවද, දේවස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ල හා අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සහ විදුලි ජනක යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා වූ රු.49,961,750ක (බදු සහිත) පිරිවැය ඇස්තමේන්තුව සහිත කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1.6 ට පටහැනිව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත සෘජු කොන්ත්‍රාත්තුවක් ලෙස පවරා තිබූ අතර එම ආයතනය විසින් එදිනම උක්ත ව්‍යාපෘතිය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත උප කොන්ත්‍රාත් ලබාදී තිබුණි. ප්‍රසම්පාදන කටයුතු පූර්ව සැලසුම් ප්‍රකාරව සහ ප්‍රමාණවත් ප්‍රතිපාදන පවතින බව තහවුරු කර ගත් පසු පමණක් ආරම්භ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබීම නිසා ප්‍රතිපාදන නොමැති වීමෙන් දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම නතර කර තිබුණි. | අංක අ.ම.ප. 19/3086/122/066-1 හා 2019.11.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ මේ සම්බන්ධව කටයුතු කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ආවරණය නොවන අතර ප්‍රශස්ථ සැලසුම්කරණයකින් යුතුව අරමුදල් මෙහෙය වීමට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | තිස්සමහාරාමය, දෙබරවැව ශ්‍රී විසුද්ධාරාම විහාරයේ, සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව රු.96,920,505ක ඇස්තමේන්තුවක් සකසා තිබූ අතර එහි පළමු අදියර ලෙස රු.6,527,400ක් වටිනා ඉදිකිරීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1.6 ට පටහැනිව 2019 නොවැම්බර් 05 දිනැති අංක අ.ම.ප. 19/3086/122/066-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත සෘජු කොන්ත්‍රාත් ලෙස ප්‍රදානය කර තිබුණි. අදාල ඉදිකිරීම සඳහා 2019 අගෝස්තු 27 දින ගිවිසුම්ගත වී තිබූ නමුත් ගිවිසුම ඇතිකර ගැනීමට පෙර රු.4,487,361 ක් එනම් පළමු අදියරෙහි කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 79 ක් ඉදිකිරීම් ආයතනය වෙත ගෙවා තිබුණි. මෙහි පළමු අදියරෙහි ඉදිකිරීම් 2019 පෙබරවාරි 18 දින | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත සෘජුව කොන්ත්‍රාත් පිරිනැමීමට ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත සෘජුව පවරන ලදී. 2020/2021 වසර තුළ අරමුදල මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා මත ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇත. එවන ලද ප්‍රගති වාර්තා අනුව මේ වන විට මෙම ව්‍යාපෘති ඉදිකිරීම් 85% ක පමණ වැඩ අවසන් කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ආවරණය වන කාලය ඉක්මවා ඇත. ප්‍රශස්ථ සැලසුම්කරණය කින් හා සම්බන්ධීකරණය කින් යුතුව සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කළ යුතුයි. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ආරම්භකර 2019 මැයි 18 දින වන විට අවසන් කල යුතු බවට ගිවිසුම්ගත වී තිබුණද, විගණිත දින වූ 2021 දෙසැම්බර් 31 වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | | |

## 2.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක DMS/E1/54/9/241 දරන 2011 ජූලි 21 හා 2011 නොවැම්බර් මස 22 දිනැති ලිපි හා අංක DMS/1731 Vol-I දරන 2017 අප්‍රේල් 28 දිනැති ලිපි මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අරමුදල වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක්, තෘතියික මට්ටමේ තනතුරු 46 ක්, ද්විතියික මට්ටමේ තනතුරු තනතුරු 478 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 2,468 ක් වශයෙන් 3008ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 5ක්, තෘතියික මට්ටමේ තනතුරු 19ක්, ද්විතියික මට්ටමේ තනතුරු 144ක්, ප්‍රාථමික මට්ටමේ තනතුරු 662ක්, වශයෙන් තනතුරු 830 ක් පුරප්පාඩු වී පැවතුනු අතර ද්වීතියික මට්ටමේ තනතුරු 69 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 77ක් වශයෙන් තනතුරු 146 ක් අතිරික්තව පැවතුනි. | මධ්‍යම සංස්කෘතික අරමුදලේ දැනට අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා අභ්‍යන්තරයෙන් සුදුසුකම්ලත් නිළධාරීන්ට උසස් වීම් ලබා දී එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. | අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | 2018 පෙබරවාරි 14 දින ඉදිරිපත් කර තිබූ අරමුදලේ බඳවා ගැනීමේ පරිපාටිය සඳහා විගණිත දින වූ 2022 පෙබරවාරි 28 දින වනවිටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට අරමුදල කටයුතු කර නොතිබුණි. | නව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කරමින් පවතින අතර එය අවසන් වූ වහාම කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීමට නියමිතය. | බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1.2 වගන්තිය ප්‍රකාරව නව තනතුරු ඇතිකිරීම හෝ සේවක සංඛ්‍යාව වැඩි කිරීම කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා නොගෙන අරමුදලේ හෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරු තුළ ඇතුළත් නොවූ මුරකරුවන් 2,271 ක් සහ කම්කරුවන් 1,130 ක් වශයෙන් සේවකයින් 3,401 ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් බඳවා ගැනීමට 2017 ඔක්තෝබර් 17 දින පාලක මණ්ඩලය අනුමත කර තිබුණි. ඒ අනුව 2019 සැප්තැම්බර් | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් බඳවා ගත් පුරාවිද්‍යා සහායකයින් හා මුරකරුවන් සියලුම දෙනාගේ සේවය අවසන් කොට තිබේ. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව වෙනත් දෙපාර්තමේන්තුවක් වෙනුවෙන් සේවකයින් බඳවා ගැනීමෙන් වැලකිය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | 30 දින වනවිට පුරාවිද්‍යා සහායකයින් (කම්කරුවන්) 934 ක් සහ මුරකරුවන් 553 ක්ද වශයෙන් එකතුව 1,487ක් අරමුදල විසින් බඳවාගෙන තිබුණි. මෙසේ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක් වෙනුවෙන් බඳවා ගත් සේවකයින්ට 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා පිලිවෙලින් රු.479,356,993ක්, රු.581,773,108ක් සහ රු.123,499,165ක් අරමුදල විසින් වැටුප් ගෙවා තිබුණි. | | |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව බඳවාගන්නා ලද නිලධාරීන් 5 ක් සඳහා 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1/2015(I) චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාර මාසික ප්‍රවාහන දීමනා රු.50,000ක් බැගින් හා ඉන්ධන දීමනා රු.16,440ක් බැගින් 2019 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා රු.1,921,251 ක් ගෙවා තිබුණි. | ආයතනික කටයුතු පුලුල් වනවාත් සමග අනුමත කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් මෙසේ අනියම් පදනම හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් කිරීමට සිදුව තිබේ. | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනි ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| ( ඉ) | තනතුරු 03ක් සඳහා බඳවාගත් නිල වාහන සඳහා හිමි කමක් නොතිබු නිලධාරීන්ට නිල වාහන සපයා දී තිබූ අතර එම වාහන සඳහා පාවිච්චි කරන ලද ඉන්ධන ලීටර් 12,629.27 ක් සඳහා රු.1,312,222 ක් වැයකර තිබුණි. | මෙහි සඳහන් නිළධාරීන් අතුරින් දැනට සේවයේ නියුක්තව සිටිනුයේ එක් අයෙකු පමණි. අනෙකුත් නිළධාරීන්ගේ සේවය අවසන් කොට තිබේ. | -එම- |

**2.6 අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අභ්‍යන්තර විගණන වාර්තාවලින් පැන නැගුණු කරුණු | | |
| (i) | සීගිරිය බටහිර දොරටුව අසල ඇති ආපන ශාලාව 2016 වර්ෂයේදී ඇති කරගත් ගිවිසුමක් අනුව මාසිකව රු.130,000 කට කුලී පදනමට ලබාදී තිබූ අතර නැවත ගිවිසුම්ගත වීමෙන් තොරව එම කුලියටම 2017, 2018 හා 2019 වර්ෂ වලදීද ලබා දී තිබුණි. 2019 මාර්තු සිට දෙසැම්බර් දක්වා හිඟ කුලිය හා ප්‍රමාද ගාස්තු රු.1,303,366ක් කුලී ගැනුම්කරු වෙතින් අයකර ගෙන නොතිබුණි. | මේ සඳහා අදාළ හිඟ කුලිය හා ප්‍රමාද ගාස්තු අය කර ගැනීම සඳහා අදාළ නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත පවරා ඇත. මේ වන විට ආපනශාලාව නව ගැනුම් කරුවකු සමග ගිවිසුම්ගත වී සංචාරකයින් සඳහා අවශ්‍ය සේවා සැපයීම සිදු කරයි. | සේවා සඳහා වාර්ෂිකව ගිවිසුම් ගත වීම හා ගිවිසුම් අනුව කටයුතු කිරීම සිදු කළ යුතුයි. |
| (ii) | 2019 වර්ෂය තුල අරමුදල විසින් මහා විහාර හා ජේතවන ව්‍යාපෘති සඳහා විශාල කම්කරුවන් සංඛ්‍යාවක් මාසිකව සේවයේ යොදවා තිබූ අතර පිළිවෙලින් මිනිස්දින 35,478කින් හා 36,389කින් මිනිස්දින 10,599 ක් හා 16,264 ක් සඳහා නිශ්කාර්යව ගෙවා තිබුණි. මේ හේතුවෙන් මහා විහාර හා ජේතවන ව්‍යාපෘති සඳහා | නිරීක්ෂණයන් පිළිගනිමි. | නිෂ්කාර්යව සේවකයින් යෙදවීම වලක්වා ගැනීමටත් වියදම් අවම කර ගැනීමටත් කටයුතු |

| | | | |
|---|---|---|---|
| | කම්කරු වැටුප් ලෙස ගෙවා තිබූ පිළිවෙලින් රු.69,685,545 කින් හා රු.64,423,509 කින් රු.20,816,436ක් හා රු.28,787,280ක් නිශ්කාර්යව ගෙවීම හේතුවෙන් අරමුදලට රු. 49,603,716ක පාඩු සිදුව තිබුණි. | | කළ යුතුයි. |
| (iii) | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබානොගත් ගිණුම් නිලධාරි තනතුරු 10 ක් සඳහා වසර 02 කට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට 2016 නොවැම්බර් 25 දින අංක 199 දරන පාලක මණ්ඩල රැස්වීමේදී එම තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබූ අතර පත්කිරීම පාලක මණ්ඩල අනුමැතිය මත සිදුව නොතිබුණි. | ව්‍යාපෘති සංඛ්‍යාව වැඩිවීමත් සමග අනුමත කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් තනතුරු සංඛ්‍යාව වැඩි කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යෝජනා ඉදිරිපත් කර තිබේ. මෙසේ තනතුරු සංඛ්‍යාව අනුමත වන තෙක් සේවා අවශ්‍යතාවය අනුව නව ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පදනම මත ගිණුම් නිළධාරීන් බඳවා ගැනීමට සිදුවිය. | අනුමත තනතුරු සඳහා පමණක් විනිවිදභාවයකින් යුතුව බඳවා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (iv) | ශ්‍රී දළදා මාලිගාව ආසන්නයේ පිහිටි අරමුදලට අයත් ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්ගේ අංක PS/DSP/RAU/01/10/KP හා 2017 ජූලි 14 දිනැති ඉල්ලීම පරිදි 2017 ජූලි 23 සිට 2017 අගෝස්තු 16 දක්වා කාලය සඳහා මහනුවර ශ්‍රී පත්තිනි දේවාලයේ අවශ්‍යතා සඳහා භාර දී තිබුණද එම ගොඩනැගිල්ල ආපසු අරමුදලට භාර ගැනීමට මේ දක්වා පියවරගෙන නොතිබුණි. මේ හේතුවෙන් මෙම ගොඩනැගිල්ලේ පිහිටි තොරතුරු මධ්‍යස්ථානය වෙතින් ලබාදුන් දේශීය හා විදේශීය සංචාරකයන් වෙත නොමිලේ තොරතුරු ලබා දීම, නොමිලේ ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් පැවැත්වීම, සංස්කෘතිය හා බැඳුනු පොත් හා අනුරූ අලෙවි කිරීම, ශ්‍රී ලාංකීය සංස්කෘතිය සහ උරුමය හා බැඳුණු අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම යන සේවා වසර 4½ ක පමණ කාලයක් තිස්සේ ලබා දීමට නොහැකි වී තිබුණි. තවද අදාල ගොඩනැගිල්ලේ පවතින මිලියන 05 කට අධික බව දැක්වෙන අරමුදලේ වත්කම්ද නිශ්කාර්යව හා ඌණ උපයෝජිතව පැවතුණි. | මෙම ගොඩනැගිල්ල නැවත මධ්‍යම සංස්කෘතික අරමුදලට ලබා ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියා මාර්ග සිදුවෙමින් පවතී. | වත්කම් වල සුරක්ෂිතභාවය හා ප්‍රශස්ත උපයෝජනයටත් අරමුණු ළඟා කර ගැනීමටත් අවශ්‍ය පියවර ගත යුතුයි. |
| (v) | පොළොන්නරුව ව්‍යාපෘති කාර්යාලය විසින් උරුම කළමනාකරණ මෙහෙයුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යය අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත, නිර්මාණය කර ඉදිකිරීම් පදනම මත රු.38,926,902කට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය වෙත පිරිනමා තිබුණි. කාර්යංශය 2018 සැප්තැම්බර් 06 දින කොන්ත්‍රාත්තුව භාරගෙන තිබුණද ගිවිසුම්ගත වී තිබුණේ 2019 මාර්තු 20 දින දීය. ගිවිසුම්ගත වීමට පෙර 2018 සැප්තැම්බර් 07 දින ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4ට පටහැනිව රු.8,953,188ක එනම් සියයට 23ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. ඉදිකිරීමේ | නිරීක්ෂණයන් පිළිගනිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව හා ආර්ථිකභාවයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | මූලික සැලසුම් වෙනස් වී තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.13.4 ප්‍රකාරව අදාල අධිකාරියෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | |
| (vi) | 2001 වර්ෂයේ සිට මේ දක්වා ගඩලාදෙණිය විහාරයේ පිළිමගෙයහි ආරක්ෂාව සඳහා ස්ථිර වහලයක් සකස් කිරීමට කටයුතු කර නොතිබීම නිසා එහි බිතුසිතුවම් විනාශවීමේ අවදානමට මුහුණු දී තිබූ අතර ඉදිකිරීම් වල ව්‍යුහාත්මක වාර්තාව සඳහා 2018 වර්ෂයේ රු.645,000 ක් වැයකර තිබුණද එම සැලසුම් සඳහා පුරාවිද්‍යා උපදේශක අනුමැතිය ලබාදී නොතිබීමෙන් අදාල වියදම නිශ්කාර්ය වී තිබුණි. විහාරය සඳහා පැය 24 ක පොලිස් ආරක්ෂාවක් යොදා තිබියදී, ඉදිකර ඇති තාවකාලික වහලයේ ආරක්ෂාව සඳහා 2010 සිට 2020 දක්වා මුරකරුවන් 24 ක් දක්වා සේවයේ යොදවා තිබූ අතර ඒ සඳහා වැටුප් හා අතිකාල ලෙස දරන ලද වියදම රු.15,244,100 ක් විය. | මේ වන විට මෙහි සංරක්ෂණ කටයුතු සඳහා යොදවා තිබූ සියලුම මුරකරුවන් අරමුදලේ වෙනත් වැඩබිම් වෙත අනුයුක්ත කොට තිබේ. | වත්කම් වල සුරක්ෂිතභාවයටත් නිශ්කාර්ය වියදම් වලක්වා ගැනීමටත් අවශ්‍ය පියවර ගත යුතුයි. |
| (vii) | අරමුදල සතුව පුරාවිද්‍යා නිලධාරින්, සංරක්ෂණ නිලධාරින්, ඉංජිනේරුවන්, වාස්තු විද්‍යා නිලධාරින් හා කම්කරුවන් සිටියදී ජේතවන කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම රු.44,592,080ක ට (වැට් සහිත) කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබූ අතර එහි උපදේශන සේවාව රු.2,326,541කට වරලත් ගෘහනිර්මාණ ශිල්පියෙකුට පවරා තිබුණි. කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රාත්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබූ අතර දින 268 කින් නිම කල යුතු කාර්ය සඳහා වර්ෂයකට වැඩි කාලයක් ගත වී තිබුණද විගණිත දින වූ 2022 පෙබරවාරි 28 දින වන විටත් කාර්ය සම්පූර්ණ කර නොතිබුණි. | ඉදිරියේදී අරමුදල විසින් සිදු කරනු ලබන සෑම ඉදිකිරීමක් සඳහාම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව උපදේශන සේවා ලබා ගැනීමටත් හැකි සෑම විටම ආයතනයේ නිලධාරීන්ගෙන් එම කාර්යයන් ඉටු කරවා ගැනීමටත් කටයුතු කරන බව දන්වා සිටිමි. මෙම කොන්ත්‍රාත්තුවේ අවසන් ගෙවීම මෙතෙක් සිදු කර නොමැති අතර අදාල ප්‍රමාද ගාස්තු අවසන් ගෙවීම් කිරීමේදී ගැලපීම් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ඉදිකිරීම් ආයතන බැඳීමට යටත් වන පරිදි ගිවිසුම් වලට එළඹීමටත් ආර්ථිකභාවයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමටත් කටයුතු කළ යුතුයි. |
| (viii) | ජේතවන ව්‍යාපෘතියේ පැවති කැබ් රථයක්, ත්‍රී රෝද රථ 02ක් හා ට්‍රැක්ටර් 03ක් වෙනුවෙන් 2019 වර්ෂයේ ඉන්ධන සඳහා රු.3,191,122ක් සහ ව්‍යාපෘතියේ සංග්‍රහ වියදම් සඳහා රු.1,677,167ක් වශයෙන් අධික වියදම් දරා තිබුණි. | මේ වන විට අරමුදලේ මූල්‍ය පාලනය විධිමත් අයුරින් කරගෙන යාමට වැඩපිළිවෙලක් හඳුන්වා දී ඒ අනුව කටයුතු කරමින් පවතී. | වියදම් පාලනය සඳහා අවශ්‍ය පියවර ගත යුතුයි. |